### අවසන් ගමන යයි

# ආදාහනය මහත් හරසරින්

**බෞද්ධ ජන නායකයකු වූ අභාවප්‍රාප්ත ඇල්. එච්. මෙත්තානන්ද මහතාගේ මෘත දේහය පිළිබඳ ආදාහනය විශාල ජනකායක් ඉදිරියේ ඊයේ සවස බොරැල්ලේ කනත්තේ සුසාන භූමියේදී මහත් හර සරින් සිදුකරන ලදී.**



අභාවප්‍රාප්ත ඇල්. එච්. මෙත්තානන්ද මහතාගේ මෘත දේහය සහිත දෙන රැගත් රථය මරදානේ ආනන්ද විද්‍යාලයේ සිට කනත්තේ සුසාන භූමිය කරා පෙරහැරින් ගෙන යන ලද අවස්ථාවයි. අවමඟුල් රථය ඇදගෙන යන්නේ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයන් පිරිසකි.

අවමඟුල් පෙරහැර ආරම්භ වූයේ ඊයේ දවස පුරා මෙත්තානන්ද මහතාගේ මෘත දේහය මහජන ගෞරවය සඳහා තැන්පත් කොට තිබුණු මරදානේ ආනන්ද මහා විද්‍යාලයේ සිටය.

අවමඟුල් රථය ඉදිරියෙන් නොයෙකුත් සංවිධාන වල නියෝජිත පිරිස් ගමන් ගත්හ. ආනන්ද මහා විද්‍යාලය, නාලන්දා මහා විද්‍යාලය, මහනුවර ධර්මරාජ මහා විද්‍යාලය, බෞද්ධ ජාතික බලවේගය, වීරය බෞද්ධ බල මණ්ඩලය, ශ්‍රී සිංහල ශිෂ්‍ය සංවිධානය, රාජ්‍ය සේවා හා පළාත් පාලන සේවා බෞද්ධ සම්මේලනය, ලංගම බෞද්ධ සංගමය, සිංහල ආර්ය සමාජය, කොළඹ තරුණ බෞද්ධ සංගමය සහ තවත් සමිති සමාගම් වල නියෝජිත පිරිස් මේ අතර වූහ.

## ඕකිඩ් මල්

මෘත දේහය බහාලු දෙන සහිත රථය ඇදගෙන යන ලද්දේ ආනන්ද මහා විද්‍යාලයේ ශිෂ්‍යයින් විසිනි. එම විද්‍යාලයේ කොඩියෙන් දෙන වසා තිබු අතර ඒ මත ඕකිඩ් මල් වඩමක් තබා තිබුණි.

ආනන්ද මහා විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් කරයේ තිබුණු මෘත දේහය කනත්ත සුසාන භූමිය අසලදී බෞද්ධ සංවිධාන හා මහජනයා වෙනුවෙන් අගමැති ඩඩ්ලි සේනානායක, මුදල් ඇමැති යූ. බී. වන්නිනායක, කර්මාන්ත ඇමැති පිලිප් ගුණවර්ධන, අධ්‍යාපන ඇමැති අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල, ස්වදේශ ඇමැති ආචාර්ය ඩබ්ලිව්. දහනායක, වැඩ බලන විපක්ෂ නායක වී. නී. ඉලංගරත්න, දෙවිනුවර මන්ත්‍රී රෝනී ද මැල් යන මහතුන් විසින් පිළිගන්නා ලදී.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය මොරටුවේ සාසනරතන හිමියන් විසින් පැමිණ සිටි පිරිස පන්සිල්හි පිහිටුවීමෙන් පසු ආගමික වතාවත් ඉටු කරන ලදී.

රැස්ව සිටි පිරිස් අමතා කතා කළ විද්‍යෝදය පරිවේණාධිපති කළුකොඳයාවේ ප්‍රඥාසේඛර මහානායක මාහිමියෝ පරලොව සැපත් මෙත්තානන්ද මහතා සිංහලයකු යැයි ආඩම්බරයෙන් පෙන්වන්නට පුලුවන් කෙනෙකැයි කීහ.

## උදාර අදහස්

මේ මහත් උදාර අදහස් රාශියකින් පිරි සිටි මහා පුරුෂයෙක්, තමා තුළ තිබූ එඩිතර කමත්, තේජස්වී ගතියත් අවංක කමත් නිසා ඔහු මිනිසුන් වසඟකර ගත්තායිද උන් වහන්සේ පැවසූහ.

මෙත්තානන්ද මහතාගේ ඇතුළත පිරිසිදු බවද ඔහු කිසි විටක කීර්තිය හෝ ලාභය අපේක්ෂා නොකළ බවද සඳහන් කළ මහා නායක මාහිමියෝ ඒ මහතාට බනැම කෙනෙකු ඉදිරියේ කෙලින්ම කතා කරන්න පුලුවන් වූයේ පුද්ගලික දියුණුව අපේක්ෂා නොකළ නිසා බවිද පළ කළහ.

බාල පරපුර මෙත්තානන්ද මහතා අනුගමනය කළොත් එය ඒ මහතාට දක්වන ලොකුම ගෞරවය යැයිද ප්‍රඥාසේඛර මාහිමියෝ පැවසූහ.

## අහිංසා සටන්

මඩිහේ පඤ්ඤාසීහ මහා නායක මාහිමියෝ කතා කරමින් මෙලොව උපන් අංග සම්පූර්ණ එකම පුද්ගලයා බුදුන් වහන්සේ බවත්, අනෙක් හැම දෙනාම ළඟ හොඳ නරක දෙකම ඇති බවත් මෙත්තානන්ද මහතා ළඟ වැඩියෙන් තිබුණේ හොඳ බවත් ප්‍රකාශ කළහ.

අධ්‍යාපනයට විශාල සේවාවක් ඉටු කළ මෙත්තානන්ද මහතා විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කළේ යැයිද, ඒ මහතාගේ අහිංසා සටන් නිසා සිංහල භාෂාවට සිංහල රටේ තැනක් ලැබුණේයි, ආගමට ජාතියට හිතවත්ව කටයුතු කරන අතරම චාම් ජීවිතයක් ගත කරමින් ජනතාවට ආදර්ශයක් දුන්නේ යැයිද පඤ්ඤාසීහ මාහිමියෝ පැවසූහ.

6 වැනි පිටුව බලන්න

## ආදාහනය...

1 වැනි පිටුව හා සම්බන්ධයි

චිතකයට ගිනි දල්වන ලද්දේ දොස්තර සී. පටුවිතවිතාන සහ සී. ඇස්. පටුවිත විතාන යන මහත්වරු විසිනි.

අභාවප්‍රාප්ත ඇල්. එච්. මෙත්තානන්ද මහතා අවුරුදු [illegible]වයක්ම විද්‍යාලයාධිපති වශයෙන් සේවය කළ කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ වර්තමාන ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ද ආදි ශිෂ්‍යයින්, හිටපු ආචාර්ය වරුන් දෙගුරුන් හා අවශේෂ මහජනයාද ඒ මහතාට අවසාන ගෞරවය දැක්වීම සඳහා දහස් ගණනින් ඊයේ ආනන්ද මහා විද්‍යාලයට රොක්වූහ.

මෙත්තානන්ද මහතාගේ මෘත දේහය කොළඹ හැව්ලොක් ටවුමේ "පාක් වේ" මාවතේ පිහිටි ඒ මහතාගේ නිවසේ සිට ඊයේ උදේ 9 ට පමණ කොළඹ ආනන්ද මහා විද්‍යාලයට ගෙන එන ලදී.